රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 11/2018

මාගේ අංක : MPA/IAD/ADM/GA02/DR/18

රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ

නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07.

2018.06.22

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## "මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතිය" ප්‍රකාශයට පත් කිරීම
## (2018.06.26 සිට 2018.07.02 දක්වා)

උක්ත කරුණ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් විසින් යොමු කල අංක PS/DSP/DPU/07/18 හා 2018.06.12 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

02. මතින් නිදහස් ශ්‍රී ලංකාවක් බිහි කිරීම උදෙසා දීප ව්‍යාප්තව **මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම තුලින් ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් සංවර්ධනයට පසුබිම් සැකසෙන අතර මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් ලංකාව මුදාගැනීමේ ජාතික කර්තව්‍ය ඉටුකර ගැනීම සඳහා වූ සෘජු දායකත්වය ද ලබා දෙයි.

03. ඉහත අරමුණු ඇතිව, මත්ද්‍රව්‍ය භාවිතය, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට එරෙහි වෙමින් **"මතින් නිදහස් රටක්"** ජාතික වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් ලංකාව මුදාගැනීමේ අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතිය තුල දීප ව්‍යාප්තව වැඩසටහන් සංවිධානය කිරීමට නියමිතය. ඒ සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකායට සම්බන්ධිත අනෙකුත් ආයතන සමඟ එක්ව **"මත්ද්‍රව්‍ය භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනය"** ට සමගාමීව 2018.06.26 දින සිට 2018.07.02 දක්වා කාලය **"මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතිය"** ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

04. ඒ අනුව මෙම මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතියේදී සියළුම රාජ්‍ය ආයතනවල පහත සඳහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට විශේෂ අවධානය යොමු කල යුතු අතර මින් ඉදිරියටද ඔබ ආයතනයේ හා අනුබද්ධිත සියළුම ආයතනයන්හි මෙම වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

I. සියළුම රාජ්‍ය ආයතන තුල මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහිව බලගැන්වීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා ඒවා සක්‍රීයව පවත්වා ගනිමින් මත්ද්‍රව්‍ය භාවිතය නිසා වෘත්තිමය ගෞරවයට වන හානිය, කාර්යාක්ෂමතාවයට සහ ඵලදායීතාවයට වන හානිය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු යෙදිය යුතුය.

II. දුම්පානය හා මද්‍යසාර පිළිබඳ රූපමය අවවාද ඇතුළත් පුවරු සෑම රාජ්‍ය ආයතනයකම ප්‍රදර්ශනය කල යුතු වන අතර, මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රචාරණය වන සුළු හෝ දර්ශන ඇතුළත් පුවරු, චිත්‍ර නිර්මාණයන් රාජ්‍ය ආයතන පරිශ්‍රයන් තුළ ප්‍රදර්ශනය කිරීම සම්පූර්ණයෙන් තහනම් වන අතර එවැනි තත්ත්වයන් සිදු නොවීමට වගබලා ගත යුතුය.

III. මත්ද්‍රව්‍ය භාවිතයේ ඇති අහිතකර ප්‍රතිවිපාක පෙන්නුම් කරමින් මෙම පණිවිඩය සමාජයට මුදා හැරීම සඳහා සුදුසු, ඵලදායී සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම තුලින් දරුවන්ටත්, ජනතාවටත් මත්ද්‍රව්‍ය නිවාරණ පණිවුඩය සම්ප්‍රේෂණය කිරීම.

IV. ඔබ ආයතනය මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් ස්ථානයක් බවට ඔබ ආයතනයට පැමිණෙන සේවා ලාභීන් දැනුවත් වීමට දැන්වීම් පුවරු, පෝස්ටර්, බැනර් ආදිය ප්‍රදර්ශනය තුලින් පොදු මහජනතාව අතරට මෙම පණිවුඩය යොමු කිරීමට පියවර ගැනීම.

V. එමෙන්ම ආයතන සංග්‍රහයේ II කාණ්ඩයෙහි XLVIII වැනි පරිච්ජේදයෙහි 2 වගන්තිය කෙරෙහි අවධානය යොමු කොට එම විධිවිධාන ක්‍රියාවට නැංවීම සඳහා විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

05. ඒ අනුව මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සතිය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳ තොරතුරු මට ද පිටපතක් සහිතව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

06. අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන **"මතින් නිදහස් රටක් "** ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීම උදෙසා ඉහත සඳහන් සියළුම කරුණු ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ක්‍රියාත්මක කරවීම ඔබගේ වගකීමක් බව පෙන්වා දීමට කැමැත්තෙමි.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

පිටපත්:

01. ජනාධිපති ලේකම් (ජනාධිපති කාර්යාලය) } ඔබගේ අංක PS/DSP/DPU/01/02/02 හා 2018.06.18 දිනැති ලිපිය අනුව කරු. දැ.ගැ.ස